



# පහසුවෙන් රැකියාවක් සොයාගන්න මගක්...

2003 වසරේදී ආරම්භ කරන ලද topjobs සේවාව අද වන විට මෙරට ඇති ප්‍රමුඛතම රැකියා සොයා දීමේ ව්‍යාපෘතිය බවට පත්ව තිබේ. එවකට සිටි ආතර් සී ක්ලාක් මහතාගේ අදහසකට අනුව ආරම්භ කරන ලද මෙම topjobs සේවාවෙහි නිර්මාතෘ වන්නේ වත්මන් ජෙනිසිස් ආයතනයේ ප්‍රධාන අධ්‍යක්ෂක ධුරය හොබවන ආචාර්ය වික්‍රමසේන වීරසූරිය මහතායි. topjobs සේවාව මගින් රැකියා ලබාදීමේ ක්‍රම පටිපාටිය පිළිබඳව අපි ඒ මහතාගෙන් විමසීමක් කළා.

■ **topjobs සේවාව යනු** නොමිලේ රැකියා සපයා දෙන සේවාවක්. මේ සඳහා කිසිම කෙනෙක් රැකියා ස්ථාන සොයමින් යා යුතු නැහැ. තමුන්ට නිවසේදීම සුදුසු රැකියාවක් සොයා ගන්න පුළුවන්.

■ **රැකියාවක් සොයා ගන්නා අයුරු** නිවසේ අන්තර්ජාල පහසුකම් ඇති පරිගණකයක් තියෙනවා නම් වඩා පහසුයි. ඔබට අන්තර් ජාලය තුළින් www.topjobs.lk යන වෙබ් අඩවිය පරීක්ෂා කර සුදුසුම රැකියාව සොයා ගන්න පුළුවන්. එහි විවිධ අන්දමේ රැකියා පුරප්පාඩු ඉතා පිළිවෙලින් සඳහන් කර තියෙනවා. දැනට රැකියා වර්ග 250 ක් පමණ තියෙනවා.

■ **රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීම** මේ වෙබ් අඩවිය හරහාම සිදු කරන්න පුළුවන්. පළමුවෙන්ම සුදුසු රැකියාව තෝරාගෙන ඒ වෙබ් අඩවිය තුළින්ම ඉල්ලුම් පත්‍රයක් සකස් කර ඒ අවස්ථාවේම යවන්න පුළුවන්. ඒ නිසා ඉල්ලුම් කිරීමේ කටයුත්තත් හරිම පහසුයි. මේ සඳහා සියලු පහසුකම් ඒ වෙබ් අඩවිය තුළ සකස් කර තියෙනවා.



ආචාර්ය වික්‍රමසේන වීරසූරිය මහතා

■ **මේ කටයුතු සඳහා අය කිරීම්**
කිසිවක් නැහැ. රැකියා සොයා දීමේ කටයුත්ත මේ වෙබ් අඩවිය හරහා නොමිලේ සිදුවෙන දෙයක්.

■ **ආයතනයක පුරප්පාඩු** මේ වෙබ් අඩවිය තුළ පළ කර ගැනීමට නම් සුළු මුදලක් අය කරනවා. අවශ්‍ය අයට පහත දුරකථන අංක වලින් හෝ වෙබ් අඩවිය හරහා වැඩි විස්තර ලබාගන්න පුළුවන්. සාමාන්‍යයෙන් පුරප්පාඩුවක් සති 2 ක පමණ කාල වකවානුවක් මේ වෙබ් අඩවිය තුළ පළ කර තිබෙනවා.

■ **පුරප්පාඩු සඳහා කැඳවීම් ලැබීම දැන ගැනීම** මේ හරහා සිදු වෙනවා.
ඔබ යම් රැකියාවක් තෝරාගෙන ඒ ක්ෂණයෙන්ම ඒ තුළ ඇති අදාළ ස්ථානය හරහා ඉල්ලුම් පත්‍රයක් (දත්ත ඇතුළත් කර යැවීම) සකසා යැවූ පසු අදාළ ආයතනය විසින් ඒ සියලු විස්තර සලකා බලනු ලබනවා. ඔබව තෝරා ගතහොත් ඒ බව දින කිහිපයක් තුළ එම වෙබ් අඩවිය හරහාම දන්වා එවනවා. සාමාන්‍යයෙන් පුරප්පාඩුවක් පළ කර දින දෙකක් තුනක් ඇතුළත අධික ලෙස ක්ෂණිකව ගලා එන ඉල්ලුම්පත් නිසා එම පුරප්පාඩුව පිරවෙනවා. ඒ නිසා කල් ගත කරමින් ඒ සඳහා බලා සිටිය යුතු නැහැ.

■ **මේ ක්‍රමය තුළ ඇති විශේෂ වාසි** රැසක් තිබෙනවා. සාමාන්‍යයෙන් යම් ආයතනයක පුරප්පාඩු ඇති බව මේ වෙබ් අඩවිය තුළ පළ කළ පසුව දින දෙක තුනකින් ඒ පුරප්පාඩුව අවසන් වුණත් සති දෙකක කාලයක් අනිවාර්යෙන්ම පළ කර තිබීම නිසා එය එම ආයතනයට ප්‍රචාරය ලැබීමක් වෙනවා. ඒ වගේම රැකියාවක් සොයා ගත යුතු කෙනෙකුට අවශ්‍ය සියලුම කටයුතු සුළු කාල පරාසයක් තුළ එකම වෙබ් අඩවියක් හරහා කරගන්න හැකියාව ලැබෙනවා. රැකියාවක් සොයා ගැනීම, ඉල්ලුම්පත් යැවීම හා කැඳවීම් ලබා ගැනීම යන සියලුම කටයුතු සිදු කරගන්න පුළුවන්. ඒ නිසා රැකියා සොයමින් කල්ගත කිරීමට හෝ තැපැල් මාර්ගයෙන් ඉල්ලුම්පත් යවා කැඳවීම් පැමිණෙන තුරු බලා සිටීමට කාලය ගත කළ යුතු නැහැ. ඒ වගේම ඉල්ලුම් පතක් නවීන ආකාරයට නිසි අයුරින් සකසන ආකාරය, සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දිය යුතු ආකාරය, හැඳ පැළඳගෙන යා යුතු ආකාරය ඇතුළු සියලුම විස්තර මෙම වෙබ් අඩවිය තුළ සඳහන් කර තිබීම තවත් පහසුවක්.
මේ හරහා ඉල්ලුම් පතක් සකසා යැවීමේදී ග්‍රාම සේවා සහතික හෝ වෙනත් එවැනි අවශ්‍ය බාහිර ලියකියවිලි පවා ඇතුළත් කර යවන්න පහසුකම් සලසා තිබෙනවා. ලියකියවිලි කඩා බැලීමට වැය කරන කාලය මින් ඉතිරි වීම නිසා පුරප්පාඩු පළ කරන ආයතනය සඳහා සුදුසු සේවකයෙක් තෝරා ගැනීම පහසුවක් වෙනවා. රැකියා සොයන්නෙකුට ඉතාම පහසුවෙන් මෙම වෙබ් අඩවිය හරහා රැකියා සොයා ගත හැකිවන ආකාරයෙන් ඒවා පෙළගස්වා තිබෙනවා. නිදසුනක් ලෙස ගණිත අංශයෙන් ඇති පුරප්පාඩු මොනවාද යන්න දැන ගැනීමට එක් ස්ථානයක්ද, අලෙවිකරණය සම්බන්ධව ඇති පුරප්පාඩු දැන ගැනීමට තවත් ස්ථානයක්ද ආදී වශයෙන් වෙන්කර තිබෙනව. අවශ්‍ය අයට එම අදාළ ස්ථාන වෙත ගොස් පරීක්ෂා කර බැලිය හැකියි.
එමෙන්ම යම් ආයතනයක් විසින් මෙම වෙබ් අඩවිය හරහා සේවකයන් තෝරා ගත් පසුව අදාළ අංශ ප්‍රධානියෙකු විදෙස්ගත වීමෙන් හෝ වෙනත් ස්ථානයක සිටියහොත් ඔහුට මෙම පුද්ගලයාගේ ජීව දත්ත පත්‍රය විද්‍යුත් තැපෑලෙන් යැවීම හරහා ඔහුගේ කැමැත්ත අකමැත්ත ලබා ගැනීමේ පහසුවද තිබෙනවා.

■ **දැනට රැකියා පුරප්පාඩු පෙළ ගැසී ඇති ආකාරය**
මෙරට තුළ ගිණුම් කටයුතු (book keeping) සඳහා ඇති රැකියා පුරප්පාඩු තමයි වැඩි වශයෙන් තිබෙන්නේ.
ඒ කියන්නේ රැකියා පුරප්පාඩු ලැයිස්තුවේ ඉහළින්ම තිබෙන්නේ ගිණුම් කටයුතු සඳහා වන රැකියා. ඉන්පසුව මෘදුකාංග ඉංජිනේරු වරුන් සඳහා වන තනතුරුත්, තෙවනුව අලෙවිකරණ සම්බන්ධව ඇති රැකියා පුරප්පාඩුවත් පිළිවෙලින් තිබෙනවා. ඒ නිසා මෙවැනි අංශවල රැකියාවන්ට යොමු විය හැකි පිරිසට ඕනෑ තරම් රටේ පුරප්පාඩු තිබෙන බව කියන්න පුළුවන්. මේ වෙබ් අඩවිය තුළ සුදුසුකම් අවම අය, (සා:පෙළ හෝ නොමැති පිරිසගේ සිට) උපාධි සහ ඊටත් ඉහළ සුදුසුකම් දක්වා වූ ඕනෑම වර්ගයකට සුදුසු රැකියාවන් ඇතුළත්.

■ **දිනකට මේ වෙබ් අඩවිය හරහා රැකියා සොයා එන පිරිස**
දස දහසකට අධිකයි. ඒ නිසාම ඉතාම ඉක්මනින් පුරප්පාඩු පිරවීම සිදු වෙනවා. සාප්පු සවාරියේ යනවා හා සමානව මේ වෙබ් අඩවිය හරහා රැකියා සොයා සැරිසරන්න පුළුවන්.

■ **මේ හරහා මසකට රැකියා ලබාදෙන ගණන** පනස් දහසකට අධිකයි. ඒ ස්ථිර වශයෙන්ම රැකියා ලැබෙන පිරිස පමණයි.

අන්තර්ජාල සේවය හරහා ක්ෂණිකව රැකියා ලබා ගත හැකි මෙවැනි මාර්ග මෙරටට තවමත් නැවුම් වූ අද්දැකීමක් වුවද විදෙස් රටවල් සඳහා නම් මෙවැනි ක්‍රම මවිතයට කරුණක් නොවනු ඇත. කෙසේ නමුත් මෙවැනි පහසු මාර්ගයක් ඔස්සේ රැකියා ලබාගත හැකි වීම මෙරට රැකියා සොයන්නන් හට මහඟු සේවාවක් ලෙස සඳහන් කළ හැකියි. සරත් අමුණුගම අමාත්‍යතුමා විසින් කැබිනට් අනුමැතිය ලබාගත් මෙම topjobs සේවාව තුළ පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ රැකියාද ඇතුළත් කර තිබෙන අතර විදෙස්ගත රැකියාද සොයාගත හැකිය. www.topjobs නම් වූ මෙම වෙබ් අඩවියට පිවිස අවශ්‍ය තොරතුරු ලබාගත හැකියි.

**දිනිති අභයවර්ධන**

ඡායාරූප
**චානුක කුලසේකර**